# ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශයේ ස්වරූපය සහ වර්තමානය තුළ රක්ෂණ ව්‍යාපාරයේ ආර්ථික කාර්යභාරය හා වැදගත්කම පිළිබඳ විමසීමක්

ඩබ්ලිව්.එම්.ඩබ්ලිව්.ජී. ජනිඳු මියුසර[1]

**සංක්ෂේපය**

රක්ෂණය වර්තමානයේ ඕනෑම ආර්ථිකයක් තුළ ඉතා වැදගත් උපකාරක සේවාවක් ලෙස කැපී පෙනේ. ආර්ථිකයේ නිෂ්පාදන පරිභෝජන ක්‍රියාවලිය වඩා ක්‍රමවත් හා අඛණ්ඩ ලෙස ක්‍රියාත්මක වීමට ප්‍රබල ලෙස රක්ෂණය උපකාරී වන බව ප්‍රායෝගිකව බලන කළ පෙනේ. සම්ප්‍රදායික ලෙස හඳුනාගනු ලැබූ රක්ෂණ අංශයේ කාර්යභාරය ඉක්මවා ගොස් වඩාත් ප්‍රායෝගික ස්වරූපයකට දියුණු වී ඇති බව ගෝලීය රක්ෂණ කර්මාන්තය දෙස අවධානය යොමු කරන විට අවබෝධ වේ. මෙසේ ගෝලීය ප්‍රවණතාවන් පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා රක්ෂණ අංශයේ ද සැලකිය යුතු වර්ධනයක් පසුගිය වර්ධනය තුළ සිදු වී ඇත. එම අංශයේ මූල්‍ය වත්කම් වර්ධනය හා ක්‍රමවත් නීත්‍යානුකූල පසුබිමක් දැකගත හැකි ය. මෙම ලිපිය තුළින් රක්ෂණ කර්මාන්තය පිළිබඳ හැඳින්වීමක් සිදු කරන අතර රක්ෂණයේ ආරම්භය හා විකාශය, එහි නීත්‍යානුකූල පසුබිම, රක්ෂණ මූලධර්ම, රක්ෂණ ආයතන මඟින් හඳුන්වා දී ඇති විවිධ රක්ෂණයන්, ශ්‍රී ලංකාවේ රක්ෂණ අංශයේ උපනතීන් හා රක්ෂණ ව්‍යාපාරයේ වැදගත්කම හා එහි කාර්යභාරය යන කරුණු යටතේ තොරතුරු විස්තර කරනු ලැබේ.

**මුඛ්‍ය පද** : රක්ෂණය, ආර්ථික වැදගත්කම, ශ්‍රී ලංකා රක්ෂණ අංශයේ කටයුතු

**හැඳින්වීම**

රක්ෂණය වර්තමානයේ පුද්ගල ආර්ථික ජීවිතය තුළ අත්‍යවශ්‍ය සේවාවක් බවට පත් වී ඇත. එය ආර්ථිකයේ කුටුම්භ හා නිෂ්පාදන යන දෙඅංශයට ම එකසේ වැදගත් වන සේවාවකි. කුටුම්භ සුභසාධනය ඉහළ නැංවීමට මෙන් ම නිෂ්පාදන අංශය තුළ සිදුවන නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීමට මෙයින් ඉඩ සැලසේ. විශේෂයෙන් ම නිෂ්පාදන ක්‍රියාවලිය තුළ බොහෝ විට මුහුණපාන අවදානම් තත්ත්වයන් අවම කිරීමට රක්ෂණය හේතු වේ. ආර්ථිකයක භාණ්ඩ හා සේවා නිෂ්පාදන ප්‍රවාහය ක්‍රියාත්මක වීමට පදනම් වන මූලික අවශ්‍යතාව වන්නේ ලාභ ලැබීම යි. ලාභ උපරිම කරණය වීම සිදුවන්නේ අවදානම් මත බර තබන ලද නිෂ්පාදන තීරණ මඟින් ය. ඒ අනුව ලාභ ලැබීමේ ව්‍යාපාරයක් සලකන විට එය බොහෝ අවදානම් තත්ත්වයන්ට මුහුණ දෙන බව අවබෝධ වේ. එනම් අවදානම ශූන්‍ය වන විට ලාභය ද ශූන්‍ය වන බවත් අවදානම වැඩිවන විට ලාභය ද වැඩි වන බවත් පැහැදිලි වන

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා තෙවන වසර, janidumiusara@gmail.com

කරුණ කි. මේ තත්ත්වය තුළ ලොව පුරා විශාල කර්මාන්ත බිහිවීම තුළ අවදානම් දුරීමේ හැකියාව ඉන් පෙන්නුම් කරයි. එම අවදානම් තත්ත්වයන් සඳහා ආවරණය සලසන්නේ රක්ෂණ සේවාව මඟින් ය. භාණ්ඩ හා සේවා නිෂ්පාදන කටයුතු මේ තරම් ක්‍රමවත් හා සංකීර්ණ ස්වරූපයක් ගෙන ඇත්තේ රක්ෂණ ව්‍යාපාරයේ උපයෝගිතාවයත් සමඟ බව තාර්කිකව සිතිය හැකි ය.

අවදානම හා අවිනිශ්චිතතාව යන වචන දෙක සමීප සම්බන්ධතාවක් දක්වයි. ඒ අනුව අවිනිශ්චිතතාව සමඟ ඇති චේතනාන්විත අන්තර් ක්‍රියාව අවදානම ලෙස නිර්වචනය කළ හැකි ය. ආර්ථික පරිසරය තුල පුද්ගලයන්, කුටුම්භ හා ව්‍යාපාර ආයතන ආර්ථික තීරණ ගැනීමේදී යම් මට්ටමක අවදානම් හා අවිනිශ්චිතතා තත්ත්වයන්ට මුහුණ දේ. මෙම අවදානම සම්පූර්ණයෙන් ම ඉවත් කිරීමට නොහැකි අතර එය අවම කිරීමට සහ එය අවම මට්ටමක තබා ගැනීම සඳහා පාලනය කිරීම පමණක් සිදුකළ හැකි ය.

ප්‍රතිඵලය නිසැක නොවන හෝ නිශ්චිත නොවන ඕනෑම ක්‍රියාවක් අවදානම් සහගත ය. පුද්ගලයා වාණිජ මෙන් ම සාමාන්‍ය කටයුතුවල නිරත වන විට මුහුණ දෙන අවදානම් විවිධ ස්වරූපයෙන් දැකගත හැකි ය. එනම්, I. වෙළඳපොළ අවදානම, II. ණය අවදානම, III. ද්‍රවශීලතා අවදානම, IV. මෙහෙයුම් අවදානම, V. වෙළඳ අවදානම, VI. උපාය ක්‍රමික අවදානම, VII. කීර්තිනාම අවදානම ආදිය යි. මෙම අවදානම් වලට කැමති රක්ෂණ ආයතන උපායමාර්ගිකව ලාභ ලබමින් අවදානම් අවම කිරීමේ නිරත වේ.

**රක්ෂණයේ ආරම්භය හා විකාශය**

රක්ෂණයේ ආරම්භය ජාත්‍යන්තර වෙළෙඳාම හා නාවික බලය ක්‍රියාත්මක වීමත් සමඟ සිදුවී ඇත. 17 වන සියවස මුල් භාගයේ ජාත්‍යන්තර වෙළෙඳාමේ ගිය නැව් මුහුදු බත් වීම නිසා එයින් සිදු වූ මුළු අලාභයම නැව් හිමියන්ට දැරීමට සිදු විය. මෙයට විසඳුමක් වශයෙන් නැව් හිමියන්ගේ දායකත්වයෙන් අරමුදලක් පිහිටුවා එමගින් අරමුදලට දායක වන්නන්ට ඉදිහිට සිදුවන අලාභ හානි වලදී කිසියම් මුදලක් ගෙවනු ලැබී ය. මෙම අරමුදල නිසා නැව් හිමියන් මුහුණ දුන් අවදානම පහව ගොස් ජාත්‍යන්තර මුහුදු වෙළඳාම සීඝ්‍රයෙන් වර්ධනය විය. එමගින් නැව් හිමියන්ට පමණක් නොව භාණ්ඩ යවන වෙළෙඳුන්ට ද සුරක්ෂිතතාවක් ඇති විය (ජගත්, 2012).

මෙම මුලධර්මය මත අද දැකිය හැකි රක්ෂණ ව්‍යාපාරය පදනම් වී ඇත. එනම් හානි සිදුවිය හැකි දේපළ හිමි අවදානම් සහිත පුද්ගලයන් මධ්‍යගත අරමුදලකට දායක වී එමඟින් සිදුවන හානියකදී වන්දි ලැබීමට හිමිකම් ලැබීම රක්ෂණයේ දී සිදුවේ. පුද්ගලයාගේ හා ආයතනවල අවදානම් පිළිබඳ මූල්‍යමය වගකීම් වෙනත් පාර්ශවයකට භාරදීමක් මෙහිදී සිදු වේ.

දෛනික ජීවිතයේදී මිනිසාට හා ඔහුගේ භෞතික දේපළට සිදුවන විවිධ විපත්, ජීවිත හානි, ආපදා හා අලාභ වැනි අවදානම් සඳහා ආවරණයක් සලසා ගැනීම රක්ෂණය ලෙස සරල අදහසින් නිර්වචනය කළ හැකි ය (ජගත්, 2012). එය අවදානම් තත්ත්වයන් නිසා සිදුවන අලාභ හානි වලදී පුද්ගලයන්ට හා ආයතනයලට සහනයක්

ලබාදෙන ක්‍රමවේදයක් ලෙස හඳුනාගැනේ. එනම් අවදානම් පිළිබඳ වගකීම් පැවරීමේ යාන්ත්‍රණයකි. නීතිමය වශයෙන් රක්ෂණය නිර්වචනය කරන විට රක්ෂණය යනු රක්ෂිතයා විසින් ගෙවනු ලබන වාරිකය ප්‍රතිෂ්ඨාව ලෙස සලකා රක්ෂිත උපද්‍රවයන් හේතුවෙන් රක්ෂිතයා වෙත අලාභයක් ගෙවීමට රක්ෂකයා එකඟවන රක්ෂිතයා හා රක්ෂකයා අතර ඇති කරගත් ගිවිසුමකි. ඒ අනුව රක්ෂණයෙන් කරනුයේ අවදානම තුනීකර ගැනීමකි. අනතුරු හා ආපදාවලින් ඉවත්ව සිටීමට හෝ ඒවා මගහැරවීමට රක්ෂණයට හැකියාවක් එයින් අර්ථවත් නොවේ.

වර්තමානය වන විට රක්ෂණය සමාජ අවශ්‍යතාවක් බවට පත්ව ඇත්තේ වාණිජ්‍යය විෂයේ වර්ධනයත් සමඟ ය. ව්‍යාපාරයක් ආරම්භ කර සාර්ථකව පවත්වාගෙන යාම සඳහා විශේෂයෙන් අවශ්‍යවන උපකාරක සේවාවක් වශයෙන් රක්ෂණය හැඳින්විය හැකි ය. රක්ෂණයේ ව්‍යාප්තියත් සමඟ  නූතනයේ රක්ෂණ කටයුතු හැදෑරීමට රක්ෂණ විද්‍යාව, රක්ෂණ කළමනාකරණය ලෙසින් විෂය ධාරාවන් ද බිහි වී ඇත.

ඉහත සඳහන් කළ අයුරින් රක්ෂණය ඉතාලියේ මුලින් ම ආරම්භ වුවත් එය ව්‍යාපාරයක් ලෙස සංවිධානාත්මකව වර්ධනය වූයේ එංගලන්තයේ ය. රක්ෂණය ඇති නොවන්නට දියුණු ව්‍යාපාර ඇති නොවන්නට ඉඩ තිබුණි. අද ඉතා දියුණු තත්වයට පත්ව එළඹ ඇති නාවික, ගගන ආදී ප්‍රවාහන සේවා මෙන්ම මහා පරිමාණ ව්‍යාපාර පැන නැගීමට රක්ෂණ ව්‍යාපාරය ප්‍රධාන සාධකයක් වූ බව කීම නිවැරදි ය.

ගිවිසුම් නීතියට අනුව ගිවිසුමක් ඇති වීමට අවම වශයෙන් පාර්ශවයන් දෙකක් සිටිය යුතු වේ. එසේම රක්ෂණය තුළ ද ප්‍රධාන වශයෙන් පාර්ශව දෙකක් දැකගත හැකි ය. එනම්,

1. රක්ෂකයා
2. රක්ෂිතයා

රක්ෂිතයා යනු රක්ෂණය ලබන්නා හෙවත් රක්ෂණ ඔප්පුවක් ඉල්ලුම් කරන පාර්ශවය වේ. රක්ෂකයා යනු එම ආරක්ෂාව සපයන ව්‍යාපාරික ආයතනය හෙවත් රක්ෂණ ඔප්පුව ඉදිරිපත් කරන සමාගම වේ( නිමල්, 1993). ඒ අනුව රක්ෂණ ගිවිසුම ඇති වන්නේ මේ දෙපාර්ශ්වය අතර සිදුවන ක්‍රියාවලිය අනුව ය. මෙම ගිවිසුම ලිඛිත ස්වරූපයෙන් පවතින නිසා එයින් නීත්‍යානුකූල භාවය පැහැදිළි වේ. ගිවිසුමක් අංගසම්පූර්ණ වීමට තිබිය යුතු මූලික ලක්ෂණයන් රක්ෂණය පිළිබඳව ඇති කරගනු ලබන ගිවිසුමක ද දක්නට ලැබෙන නිසා රක්ෂණය ගිවිසුමක් ලෙස හඳුනාගැනේ. මේ නිසා රක්ෂණය ව්‍යාපාරයක් වශයෙන් මහජන ප්‍රසාදය දිනාගෙන පවත්වාගෙන යාමට හැකි අයුරින් විශ්වාසනීය ව්‍යාපාරයක් බවට පත් වී ඇත. රක්ෂණයේ දී සිදු වනුයේ අවදානම තුනීකර ගැනීමක් හෙවත් අවම කරගැනීමක් වේ.  අවදානමට මුහුණ දෙන සියලු භෞතික ප්‍රපංචයන් ප්‍රධාන වශයෙන් කොටස් දෙකකට බෙදිය හැකි වේ. එනම්,

1. දේපළ
2. මිනිස් ජීවිත

මෙම කරුණු දෙක සම්බන්ධයෙන් සිදුවන අවදානම් තත්වයන් සඳහා පිළියමක් වශයෙන් රක්‍ෂණය වැදගත් වේ. මේ නිසා වර්තමානයේ දේපළ රක්‍ෂණය මෙන් ම ජීවිත රක්‍ෂණය ද බහුලව ම දක්නට ලැබේ. දේපලක් රක්ෂණය කිරීමෙන් බලාපොරොත්තු වන්නේ අදාළ දේපලට වන හානිය අවම කර ගැනීම හෙවත් හානියක් සිදු වූ විට එයින් ඇතිවූ අලාභය අවම කර ගැනීමට ය. දේපළ ද්‍රව්‍යාත්මක හෝ අද්‍රව්‍යාත්මක විය හැකි ය. මෙහිදී අදාළ ගිවිසුම කාලසීමාව තුළදී දේපළ සම්බන්ධයෙන් යම් හානියක් සිදු වුවහොත් ඒ සඳහා වන්දියක් හිමිවෙන අතර එම කාලය තුළ හානියක් නොවුනේ නම් එම වත්කම රක්ෂණය කිරීම සඳහා ගෙවූ වාරිකය ආපසු ලබා ගැනීමේ හැකියාව නොමැත. මේ අනුව දේපළ සම්බන්ධව රක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ හානි රක්ෂණය වේ.

ජීවිත රක්ෂණයේ දී බොහෝ විට දේපළ රක්ෂණයට වඩා හාත්පසින්ම වෙනස් තත්ත්වයක් දැකිය හැකි ය. ජීවිත රක්ෂණයේ දී අදාළ කාල පරිච්ඡේදය තුළ හානියක් සිදු වූ විට ඒ සඳහා වන්දි ලැබීමටත් රක්ෂණ සහතිකය කල් පිරුණු පසු සියලු වාරික මුදල්වල එකතුව මරණයට පත් වීමට පෙර ලබාගත හැකි සේම මහළු කාලයේ දීමනාවක් වශයෙන් ද රක්ෂණ වටිනාකම අපසු ලබාගත හැකි වේ. ඒ අනුව පුද්ගල ජීවිත සම්බන්ධව රක්‍ෂණය මූල්‍ය ප්‍රතිපාදනය කි. එය ආරක්ෂණයක් ලෙස හඳුන්වන්නේ ඉතිරි කිරීමේ ක්‍රමයක් මෙන් ම විශ්‍රාම පාරිතෝෂිත ලැබිය හැකි ක්‍රමයක් ද වන නිසා ය.

පුද්ගල ජීවිත හා ඔවුන්ගේ දේපළ අනතුරට පත් වීමට හා අලාභවලට පත් වීමට හැකියාව ඇත. මෙම තත්ත්වය තුළ ජීවිතයෙහි හා ව්‍යාපාර ක්ෂේත්‍රය සම්බන්ධව විවිධ අවිනිශ්චිතතාවන් සෑම විටම පවතී. ව්‍යාපාරික අලාභ සම්බන්ධයෙන් ඇතිවන අවිනිශ්චිතතාවන් අවදානම ලෙස හැඳින්විය හැකි ය. එම අවදානම පාලනය කිරීමට එයින් වැළකීම, එය පාලනය කිරීම හා අවදානම තමා විසින් ම දැරීම වැනි විසඳුම් මාර්ග ගතහැකි වුව ද අවදානම වෙනත් පාර්ශ්වයකට පැවරීමේදී රක්‍ෂණය අවශ්‍ය වේ.

අවදානම් සඳහා ආවරණ සලසා ගැනීමේදී සෑම අවදානමක් ම රක්‍ෂණය කළ නොහැකි ය. රක්‍ෂණය කළ හැකි අවදානම්වල ලක්‍ෂණ හඳුනා ගැනීමෙන් රක්‍ෂණය කළ නොහැකි අවදානම් පැහැදිලිව අවබෝධ කරගත හැකි ය. එනම්, රක්‍ෂණය කළ හැකි අවදානම්වල ලක්‍ෂණ ලෙස අනියත සිදුවීම්, මූල්‍යමය වශයෙන් ගණනය කළ හැකි දෑ, සත්‍යාපනය කළහැකි අලාභ,රක්‍ෂණීය අයිතියක් ඇති දෑ,සිදු වූ අලාභය වෙනත් රක්ෂිත අලාභ සමඟ සම්බන්ධ නොවිය යුතු වීම, නීති විරෝධී නොවිය යුතු ය.

**රක්‍ෂණය සම්බන්ධයෙන් යෙදෙන නීතිය**

රක්‍ෂණය ක්‍රියාත්මක වන්නේ මූලික වශයෙන් ම ගිවිසුමක් වශයෙනි. කිසියම් පාර්ශවයන් දෙකක් අතර ඇතිකර ගන්නා ගිවිසුමක් රක්‍ෂණය මඟින් පිළිඹිඹු වේ. එම නිසා ලංකාව තුළ රක්‍ෂණය සඳහා ගිවිසුම් නීතිය අදාළ වේ.

ශ්‍රී ලංකාව තුළ රක්‍ෂණය ඉංග්‍රීසි පාලන යුගයේ සිට ක්‍රියාත්මක වු බැවින් ඒ සඳහා භාවිත වූයේ ඉංග්‍රීසි නීතිය යි. එම නිසා වර්තමානයේ ද රක්‍ෂණය සඳහා ඉංග්‍රීසි නීතිය බලපානු ලබයි. ඒ අනුව ඉංග්‍රීසි නීතියත් රටේ පොදු නීතියත් ගිවිසුම් නීතියත් සංකලනය වී "**රක්‍ෂණ නීතිය**" සකස් වී ඇත. ඒ අනුව ලංකාවේ ක්‍රියාත්මක වන රක්‍ෂණ නීතිය තුළ මූලික නීතිමය ලක්‍ෂණයන් කිහිපයක් හඳුනාගත හැකි වේ (නිමල්, 1993).

(**අ**) එංගලන්ත ගිවිසුම් නීතියට අනුව සංශෝධනයන් ඇති කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන ගිවිසුම් නීතියේ මූලිකාංගයන්.

(**ආ**) කලින් කල අධිකරණය මඟින් දෙනු ලැබූ රක්‍ෂණ ගිවිසුම් වලට අදාළ විවිධ නඩු තීන්දුවලින් දෙනු ලැබූ නීතිමය උපදෙස් හා තීරණයන්.

(**ඇ**) එංගලන්තයේ නීතිගත කරනු ලැබූ ආඥාපනත් හා වරින්වර ලංකාවේ සම්මත කරනු ලැබූ ආඥාපණත් හා පනත්. උදාහරණ ලෙස,

I. 1906 මුහුදු රක්‍ෂණ ආඥා පනත
II. 1961 ශ්‍රී ලංකාවේ රක්‍ෂණ සංස්ථා පනත
III. 1969 රක්‍ෂණ සංස්ථා විශේෂ විධිවිධාන පනත
IV. 1986 අංක 42 දරණ රක්‍ෂණ පාලන (සංශෝධන) පනත.

2000 අංක 43 දරණ රක්‍ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත යටතේ 2001 මාර්තු 1 දින සිට ක්‍රියාත්මක වන ලෙස ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලය ස්ථාපිත කර ඇත. එමගින් ශ්‍රී ලංකාවේ රක්‍ෂණ කර්මාන්තය සංවර්ධනය, සුපරීක්‍ෂණය හා නියාමනය කිරීමේ වගකීම උසුලයි. ශ්‍රී ලංකාවේ රක්‍ෂණ ව්‍යාපාරය ගෞරවාන්විතව ද රක්‍ෂණ සහතික දරන්නන්ගේ හා අනාගත රක්‍ෂණ දරන්නන්ගේ සම්බන්ධතා ආරක්‍ෂාවන වෘත්තීමය හා විචක්ෂණ ආකාරයෙන් ද කිරිමට උත්සහ ගැනිම එහි අරමුණ වේ. ශ්‍රී ලංකාව තුළ රක්‍ෂණ ව්‍යාපාරයේ යෙදීමට රක්‍ෂණ ආයතන මෙම මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු ය. රක්‍ෂණකරුවෙකුට හෝ තැරැව්කරුවෙකුට රක්‍ෂණ නියෝජිතයෙකු වශයෙන් යම් පුද්ගලයෙකු පත්කිරීමට අවසර ඇති අතර එම පුද්ගලයා රක්‍ෂණ නියෝජිතයකු ලෙස එම අදාළ රක්‍ෂණකරු හෝ තැරැව්කරු සමඟ ලියාපදිංචි විය යුතු වේ. මීට අමතරව ශ්‍රී ලංකාව තුළ රක්‍ෂණ ව්‍යාපාරය සඳහා බලපානු ලබන ආයතන පහත පරිදි පෙළගැස්විය හැකි ය. එනම්,

- ජාතික රක්‍ෂණ භාර අරමුදල
- ශ්‍රී ලංකා රක්‍ෂණ සංගමය
- ශ්‍රී ලංකා රක්‍ෂණ ආයතනය
- ශ්‍රී ලංකා අපනයන ණය රක්‍ෂණ සංස්ථාව
- ශ්‍රී ලංකා කෘෂි කාර්මික සහ ගොවිජන රක්‍ෂණ මණ්ඩලය
- රක්‍ෂණ ඔප්පු හිමියන් ආරක්‍ෂා කිරීමේ අරමුදල

**රක්ෂණ මූලධර්ම**

රක්ෂණ ගිවිසුම්වලට අදාළ මූලධර්ම කිහපයක් හඳුනාගත හැකි ය. ඒවා රක්ෂණ මූලධර්ම වේ. එනම්,

1. උපරිම විශ්වාසය

රක්ෂිතයා විසින් රක්ෂණය කෙරෙන ජීවිතය හෝ දේපළ පිළිබඳව දන්නා සියලු තොරතුරු රක්ෂකයාට හෙළිදරව් කළයුතු බවත් එසේම රක්ෂකයා විසින් ද ගිවිසුමට බලපාන සියලු තොරතුරු හා කොන්දේසි රක්ෂිතයාට හෙළිදරව් කළයුතු බවත් උපරිම විශ්වාසය යන මූලධර්මයෙන් අදහස් කෙරේ. වංචාවක් හෝ වංචනික චේතනාවෙන් තොරව සද්භාවයෙන් රක්ෂණ කටයුතු සිදු වීම මෙයින් තහවුරු කරයි.

2. රක්ෂණ හිමිකම

එනම් දේපළක් හෝ ජීවිතයක් රක්ෂණය කිරීමට පුද්ගලයෙකුට ඇති නීත්‍යානුකූල අයිතිය යි. එම හිමිකම ලැබීම සඳහා පහත සඳහන් අවශ්‍යතා තුන සම්පූර්ණ කළ යුතු ය.

- උවදුරක් සිදුවිය හැකි විෂය වස්තුවක් එනම් ජීවිතයක් හෝ දේපළක් තිබීම.
- රක්ෂණය කිරීමට අදහස් කරන්නේ එම දේපළ හෝ ජීවිතය වීම.
- අදාළ දේපළ තිබීමෙන් වාසියක් වීම හා නොතිබීමෙන් අවාසියක් වීම.

3. හානි පූර්ණය

යම් රක්ෂිත දේපළකට හානියක් සිදු වූ විට එයට සරිලන වන්දියක් පමණක් ගෙවන බව මෙයින් අදහස් කෙරේ. මේ මූලධර්මය ජීවිත රක්ෂණය හෝ පුද්ගල අහඹු රක්ෂණය සම්බන්ධයෙන් බල නොපායි. මිනිස් අවයවයක හෝ ජීවිතයක වටිනාකම මුදලින් තක්සේරු කළ නොහැකි වීම මීට හේතුව යි.

4. දායකත්වය

යම් දේපළක් රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කළත් එකී දේපළට යම් අලාභයක් සිදු වූයේ නම් ඒ ඒ සමාගම නිකුත් කළ රක්ෂණ ඔප්පුවල වටිනාකම්වල අනුපාතයට අනුව පමණක් වන්දි ලබාගත හැකිබව මෙම මූලධර්මයෙන් අදහස් කෙරේ. එනම් එකම දේපළ රක්ෂණ සමාගම් කිහිපයක රක්ෂණය කළද හානියකදී වන්දි ගෙවන්නේ එම දේපළේ වටිනාකමට අදාළව පමණි. එහිදී රක්ෂණ සමාගම් කිහිපය එක්වී එම සමාගම්වලට අදාළ රක්ෂණ ඔප්පුවල වටිනාකම අනුව අලාභය බෙදා ගැනීම සිදු වේ.

5. ආදේශනය

රක්ෂණාවරණයක් ලබා තිබුණත් නැතත් කිසියම් දේපළකට බාහිර පාර්ශ්වයක වරදකින් හානියක් සිදු වුවහොත් ඒ සඳහා වන්දියක් බාහිර පක්ෂයෙන් ලබා ගැනීමට නීත්‍යානුකූල අයිතියක් තිබේ. එසේ වුව ද හානිපූර්ණ මූලධර්මයට අනුව බාහිර පක්ෂයකින් හා රක්ෂකයාගෙන් යන දෙපාර්ශ්වයෙන් ම වන්දි ලැබීමට හිමිකමක් නැත. එවැනි අවස්ථාවක රක්ෂකයාගෙන් වන්දි ලබා ගැනීමට පෙර බාහිර පාර්ශ්වයෙන් වන්දි ලබාගැනීමට රක්ෂිතයාට ඇති අයිතිය රක්ෂකයාට පවරාදිය යුතු ය. එසේ අයිතිය පැවරීම ආදේශනය ලෙස හඳුන්වයි.

6. ආසන්නම හේතුව

රක්ෂණාවරණයක් ලබාගෙන ඇති දේපළකට හානියක් වූ විට ඒ සඳහා වන්දි ඉල්ලා සිටිය හැක්කේ එම හානිය රක්ෂිත උවදුරක් සිදු වී ඇත්නම් පමණි. එමනිසා හේතු ගණනාවක් මත සිදු වී ඇති විටක හානිය සිදුවීමට බලපාන ලද ආසන්නම හේතුව රක්ෂණ ඔප්පුව තුළින් ආවරණය වී තිබේ නම් රක්ෂණ වන්දි ලබාගත හැක.

**ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන රක්ෂණ වර්ග**

1600 ගණන්වල ඇතිවුණු මුහුදු රක්ෂණයේ වැදගත්කම අවබෝධ වීමත් සමඟ පසුව වෙනස් ක්ෂෙත්‍රයන් සඳහා ද රක්ෂණය ව්‍යාප්ත වී ඇත. ගිනි නිසා ඇතිවන පාඩු පියවා ගැනිමට ගිනි රක්ෂණය ඇතිවිමත් ඉන් අනතුරුව 'ජීවිත ආරක්ෂණය' රක්ෂණ ව්‍යාපාරයට එකතු වී ඇත. එසේම පසුකාලීනව රක්ෂණ සමාගම් රථවාහන රක්ෂණය, සත්වාරක්ෂණය, සොරබිය රක්ෂණය, බාහිර පක්ෂ වගකීම් රක්ෂණය, විස්වාස ඇප රක්ෂණය, මුදල් රක්ෂණය, ගමන් බඩු රක්ෂණය හා මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය යනාදී නොයෙකුත් රක්ෂණ වර්ග හඳුන්වා දී ඇත.

රක්ෂණ ගිවිසුම් වර්ග කොටස් දෙකකට බෙදිය හැකි වේ. එනම්,

1. රක්ෂණ ගිවිසුම්

2. ආරක්ෂණ ගිවිසුම්

පුද්ගලයාට සම්බන්ධ රක්ෂණ ගිවිසුම් ආරක්ෂණ ගිවිසුම් වේ. දේපළ, වගකීම් හෝ අයිතිය සම්බන්ධ රක්ෂණ ගිවිසුම් රක්ෂණ ගණයට අයත් වේ. පුද්ගලයන්ට සම්බන්ධ රක්ෂණ ගිවිසුම් මඟින් නීත්‍යානුකූල මූල්‍ය ලාභයක් ලැබිය හැකි ය. නමුත් දේපළ, වගකීම් හෝ අයිතිය සම්බන්ධ රක්ෂණ ගිවිසුම් මඟින් ලාභ ලැබීමට, මූල්‍ය ලාභයක් ලැබීමට අවසර නොමැත. එහිදී උපරිම වටිනාකමකට රක්ෂණාවරණයක් ලබාගත්ත ද හානියක් සිදු වූ අවස්ථාවක නීත්‍යානුකූලව වන්දි වශයෙන් ලබාගත හැක්කේ රක්ෂිතයා විසින් මුදලින් දරණ වියදම පමණි. එයින් ලාභයක් ලබා ගැනීමට අයිතියක් නොමැත.

හානි පූර්ණ පදනම අදාළ නොවන රක්ෂණ වර්ගය වන්නේ ජීවිත ආරක්ෂණය හා සෞඛ්‍ය ආරක්ෂණය පමණි. ජීවිත ආරක්ෂණයේ දී ගිවිසුම නිසි ලෙස පවත්වාගෙන යන අතරතුර රක්ෂිතයාගේ මරණය සිදු වුවහොත් ගිවිසගත් පරිදි මුළු රක්ෂිත මුදලම රක්ෂිතයාගේ යැපෙන්නන්ට ගෙවනු ලැබේ.

කෙසේ වෙතත් මෙසේ ස්වභාවය අනුව ආරක්ෂණය හා රක්ෂණය වශයෙන් වර්ග කිරීමක් ප්‍රායෝගික වශයෙන් දැකගත නොහැකි වේ. එනම් මුහුදු, ගිනි, අනතුරු, රථවාහන හා ජීවිත රක්ෂණය යනාදී ලෙස රක්ෂණය වර්ග කර පවත්වාගෙන යෑම දැකිය හැකි වේ.

රක්ෂණය කළ හැකි සියළුම අලාභ හා හානි ඉහත වර්ග දෙක යටතේ වර්ග කළ හැකිය. එනම්

1. පුද්ගල රක්ෂණය - ආරක්ෂණය

   i. ජීවිතය රක්ෂණය කිරීම
   ii. ශරීර අවයව රක්ෂණය
   iii. මිනිස් අවයව රක්ෂණය
   iv. පුද්ගල අඩුපාඩු රක්ෂණය
   v. පුද්ගල සෞඛ්‍ය රක්ෂණය

2. සාමාන්‍ය රක්ෂණය - රක්ෂණය

   i. සාමාන්‍ය දේපළ රක්ෂණය
   ii. වගකීම් පිළිබඳ රක්ෂණය
   iii. මුදල් හා ගනුදෙනු කළ හැකි ලියවිළි පිළිබඳ රක්ෂණය
   iv. චංචල වත්කම් රක්ෂණය
   v. මෝටර් රථ රක්ෂණය

දැනට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා අනෙකුත් රක්ෂණ ආයතන විවිධ නම්වලින් රක්ෂණ සහතික වර්ග හැටකට පමණ ආසන්න සංඛ්‍යාවක් නිකුත් කර ඇති බව පෙනේ.

**1. ජීවිත රක්ෂණය**

පුද්ගලයාගේ ජීවිත කාලය තුළ ඔහු මුහුණ දෙන ලෙඩරෝග, අකාල මරණය, අකර්මණ්‍යතාව හා මහළු කාලය ආදී තත්වයන් සඳහා ආවරණයක් සළසා ගැනීම ජීවිත රක්ෂණය වේ. ජීවිත රක්ෂණ සහතිකයක් ලැබීමේ ප්‍රධාන අරමුණු දෙකක් පවතී.

1.ඉතිරි කිරීමේ විකල්පයක් ලෙස

## 2. අවදානම් ආවරණය කිරීමට

මෙම අරමුණු දෙක ඉටුකර ගැනීමෙදී රක්‍ෂණ ආයතන විවිධ රක්‍ෂණ ඔප්පු වර්ග හඳුන්වා දී ඇත. ඒ අනුව විවිධ ප්‍රතිලාභ සහිත රක්‍ෂණ පවතී. එනම් උත්පාදක රක්‍ෂණය, ඒකාබද්ධ ජීවිත රක්‍ෂණය, යාවජීව රක්‍ෂණය, ත්‍රිවිධ අවස්ථා රක්‍ෂණය, ද්විත්ව හදිසි අනතුරු ප්‍රතිලාභ රක්‍ෂණය, පරිවර්තනය කළහැකි ජීවිත රක්‍ෂණය, ද්විත්ව පරිත්‍යාග රක්‍ෂණය, විවිධ කාර්ය රක්‍ෂණය, ඒකාබද්ධ පරිත්‍යාග රක්‍ෂණය, පවිත්‍ර පරිත්‍යාග රක්‍ෂණය, අධ්‍යයනාධාර රක්‍ෂණය, විවාහ දායාද රක්‍ෂණය, යුග දිවි රක්‍ෂණය, සුවසෙත රක්‍ෂණය යනාදිය යි.

මෙම රක්‍ෂණ ඔප්පු වර්ග වෙනුවෙන් කරන ගෙවීම් ප්‍රමාණයන් හා ලබාදෙන ප්‍රතිලාභයන් එකින් එකට වෙනස් වේ. කෙසේ වෙතත් මෙම රක්‍ෂණ වර්ග මූලික වශයෙන් වර්ග 4 කට ඇතුළත් කළ හැකි ය.

- කාලීන රක්‍ෂණය - යැපෙන්නන්ට ආදායමක් ලැබෙන ලෙස නිශ්චිත කාලසීමාවක් තුළදී මරණය සිදු වුවහොත් පමණක් ප්‍රතිලාභ හෙවත් රක්‍ෂණ මුදල ගෙවනු ලබයි. මෙහි වාරික මුදල අඩු වේ.
- යාව ජීව රක්‍ෂණය - මෙහිදී රක්‍ෂිතයා ජීවිත කාලය පුරාවට වාරික මුදල් ගෙවීමට සිදුවේ. එනිසා කෙදිනක මරණයට පත් වුව ද ප්‍රතිලාභ ගෙවනු ලැබේ. මෙය ලාභ සහිත හෝ රහිත වශයෙන් තමන් කැමති තත්වයක් යටතේ පවත්වාගත හැකි වේ.
- පරිත්‍යාග රක්‍ෂණය - මෙම රක්‍ෂණයෙන් අවශ්‍යතා දෙකක් සම්පූර්ණ කෙරේ.එනම් නියමිත කාලය තුළ සිදුවන අකල් මරණ සඳහා ආවරණය මෙන් ම රක්‍ෂිතයා ජීවත් වුවහොත් කල් පිරීමෙන් පසුව ප්‍රතිලාභ මුදල් ද ලැබිය හැකි වේ.
- වාර්ෂික - මෙහිදී නිශ්චිත දිනක සිට මරනය දක්වා වාර්ෂික මුදලක් ගෙවනු ලැබේ. මෙයින් විශ්‍රාම ගිය පසු වාර්ෂික මුදලක් ලබා ගැනීමට හැකි වේ.

පුද්ගල රක්‍ෂණය යටතේ සෞඛ්‍ය රක්‍ෂණ වෙනුවෙන් ද විවිධ රක්‍ෂණ ඔප්පු රක්‍ෂණ ආයතන විසින් හඳුන්වා දී ඇත. කිසියම් පුද්ගලයෙකුට ජීවිත කාලය තුළදී අනපේක්‍ෂිත ලෙස මුහුණ දෙන ලෙඩ රෝග සඳහා දැරීමට සිදුවන වියදම් පියවා ගැනීමට සෞඛ්‍ය රක්‍ෂණය උපකාරී වේ. ශ්‍රී ලංකාවේ රක්‍ෂණ ආයතන විසින් හඳුන්වා දී ඇති සෞඛ්‍ය රක්‍ෂණ ඔප්පු ලෙස,

- ශල්‍ය හා ආරෝග්‍යශාලා වියදම් රක්‍ෂණය
- පුද්ගල හදිසි අනතුරු රක්‍ෂණය ඔප්පුව
- ගිලන්භාවය පිළිබඳ රක්‍ෂණ ඔප්පුව
- සුවසෙත රක්‍ෂණ ඔප්පුව
- මිනිස් හැකියාවන් පිළිබඳ රක්‍ෂණ

ජීවිත රක්ෂණය යටතේ පුද්ගලයා සතුව පවතින සුවිශේෂී දක්ෂතා, හැකියා රක්ෂණය කිරීමට පුද්ගලයන් පෙළඹේ. ලංකාව වැනි රටවල මෙම තත්වය ජනප්‍රිය නොවුව ද දියුණු රටවල සුලභව දැකිය හැකි වේ.

**02. සාමාන්‍ය රක්ෂණය**

මෙහිදී පුද්ගලයන්ගේ දේපළ, වගකීම් හා අයිතීන් සම්බන්ධව පැනනඟින අවදානම් සහගත අවස්ථාවන් ආවරණය කෙරේ. මේ යටතට අයත් රක්ෂණ ක්‍රම පහත පරිදි වර්ග කළ හැකි ය.

දේපළ රක්ෂණය

- ගිනි රක්ෂණය
- සොරභිය රක්ෂණය
- රථවාහන රක්ෂණය
- මුහුදු රක්ෂණය

වගකීම් රක්ෂණය

- පොදු වගකීම් රක්ෂණය
- පුද්ගලික වගකීම් රක්ෂණය
- නිෂ්පාදන වගකීම් රක්ෂණය
- සේවා යෝජක වගකීම් රක්ෂණය
- වෘත්තීය වගකීම් රක්ෂණය

පුද්ගල අහඹු රක්ෂණය

- හදිසි අනතුරු රක්ෂණය
- රෝහල් ගාස්තු රක්ෂණය

මූල්‍යමය හානි රක්ෂණය

- විශ්වාස ඇප රක්ෂණය
- ව්‍යාපාරික අලාභ රක්ෂණය

මීට අමතරව දේපළ රක්ෂණය යටතේ ගගන රක්ෂණය, ණය රක්ෂණය, ඉංජිනේරු රක්ෂණය, යන්ත්‍රෝපකරණ රක්ෂණය, ගමන් බඩු රක්ෂණය හා මාර්ගස්ථ භාණ්ඩ රක්ෂණය ආදී රක්ෂණයන් දක්නට ලැබේ.

**රක්‍ෂණයේ වැදගත්කම**

වර්තමානය වන විට වාණිජ ලෝකය තුළ මිනිසාට අත්‍යවශ්‍ය සේවාවක් වශයෙන් රක්‍ෂණය පෙන්වාදිය හැකි ය. පුද්ගලයා අකාල මරණයට, ආබාධිත තත්වයට රෝගී තත්වයට හා රැකියා අහිමි වීම වැනි තත්ත්වයන්ට පත්විය හැකි ය. එවැනි අවස්ථාවලදී ඔහුට මූල්‍යමය ආරක්‍ෂාවක් රක්‍ෂණය මඟින් සලසා ගත හැකි ය. එසේම පුද්ගලයා ව්‍යාපාරයක, වෘත්තීයක හෝ සේවාවක යෙදී සිටියදී සිදුවිය හැකි අනතුරු සඳහා මූල්‍යමය ආරක්‍ෂාවක් ද එයින් ලබාගත හැකි වේ.

ව්‍යාපාර පවත්වාගෙන යාමට විශාල ආයෝජනයක් කළ යුතු ය. මෙම ආයෝජනයන් ගින්න, සොරබිය, හදිසි අනතුරු හා වෙනත් උපද්‍රවයන්ට භාජනය වීමෙන් නැවතිය හැකි ය. එම අලාභ සඳහා රක්‍ෂණය මඟින් ආවරණය සලසයි. එමෙන් ම රක්‍ෂණය අලාභ අවම කිරීමේ මාර්ගයක් ලෙස අලාභ සිදුවිය හැකි ආකාරය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති රක්‍ෂණ සමාගම් සපයන උපදෙස් හා නිර්දේශ මඟින් ව්‍යාපාර හා මිනිස් ජීවිතවල අවදානම අවම කරගත හැකි වේ.

එසේම රක්‍ෂණ ආයතන වාරික වශයෙන් රැස්කර ගන්නා අරමුදල් විවිධ ව්‍යාපාර ක්‍ෂෙත්‍රයන්හි ආයෝජනය කෙරෙන බැවින් එහි ප්‍රතිලාභ මුළු සමාජයට ම හා රටට හිමි වේ. එනම් රම ආයෝජනයන් මඟින් සිදුවන ව්‍යාපාර වර්ධනය රටේ ආර්ථිකය සුභවාදී වීමට හේතු වේ.

ඒ අනුව රක්‍ෂණය පාඩු හා අවිනිශ්චිතතාවන්ගෙන් පුද්ගලයන්ගේ අභිරුචිය ආරක්‍ෂා කරන ක්‍රියාවලියක් ලෙසට සකස් වී තිබේ. එය ජීවිත හා දේපළ පාඩු පිළිබඳ අවදානම් අවම හෝ ඉවත් කරන සමාජ උපාංගයක් ලෙස හැඳින්විය හැකි ය. රටේ සාමාන්‍ය ආර්ථික වර්ධනය සඳහා විශාල දායකත්වයක් හා ක්‍රියාකාරී ස්ථාවරත්වය ලබා දෙමින් රක්‍ෂණ කර්මාන්තය මූල්‍ය ආයතන සංවර්ධනය හා මූල්‍ය සම්පත් වැඩිදියුණු කරගැනීම මඟින් අවිනිශ්චිතතා අවම කරයි.

ව්‍යාපාරිකයින් නවෝත්පාදන හඳුන්වාදීම නව වෙළෙඳ ගිවිසුම් අත්සන් කිරීම, නිෂ්පාදනය ප්‍රසාරණය කිරීම, අලුත් සමාගමක් මිලදී ගැනීම වැනි ව්‍යාපාරික පරිසරය තුළ සිදුවන කටයුතු සඳහා ආරක්‍ෂාව අවශ්‍ය වේ. මන්ද එම ක්‍රියාවන් තුළ ඇති අවදානම පෞද්ගලික ප්‍රතිලාභයට පමණක් නොව අවසාන වශයෙන් රටේ නිෂ්පාදන අංශයේ ප්‍රසාරණය කෙරෙහි බලපාන බැවිනි. එම ආරක්‍ෂාව රක්‍ෂණ කර්මාන්තය මඟින් සැලසීමෙන් ව්‍යාපාර කටයුතු වඩාත් විධිමත් වේ.

ආයෝජකයින් අපේක්‍ෂා කරන ආදායම හෝ ලාභය සත්‍ය ලාභයට හෝ ආදායමෙන් බොහෝ විට සිදුවේ. එයට හේතු වන්නේ විවිධ අවිනිශ්චිත තත්ත්වයන්ට මුහුණ පෑමයි. එම අවිනිශ්චිතතාවන් නිසා ඇතැම් විට ව්‍යාපාරිකයන්ට නිෂ්පාදන ක්‍රියාවලිය තුළ දී සාමාන්‍ය පිරිවැයවත් ආවරණය කර ගැනීමට නොහැකි වේ. එවිට ව්‍යාපාරය බුන්වත් භාවයට පත්වී නිෂ්පාදන ක්‍රියාවලිය ඇණහිටිනු ඇත. එම නිසා ව්‍යාපාරය බුන්වත් නොවී ව්‍යාපාර අඛණ්ඩතාව ආරක්‍ෂා කරන ක්‍රමෝපායක් ලෙස රක්‍ෂණය වැදගත් වේ.

සත්‍ය වශයෙන් ම රක්ෂණ කර්මාන්තය නොමැතිව ආර්ථිකයක් ප්‍රායෝගික වශයෙන් එකතැන පැවතීමට(stagnate) හැකියාව ඇත. එයට හේතුව මූල්‍ය සම්පාදන ප්‍රභවයක් ලෙස රක්ෂණය පවතින නිසා ය. මූල්‍යකරණයක් නොමැතිව ව්‍යාපාර ප්‍රසාරණය නොවේ. ව්‍යාපාර ප්‍රසාරණය නොවන විට නව රැකියා අවස්ථා නිර්මාණය නොවේ. එවිට පවතින කර්මාන්තවල සේවකයන් ඉවත් කිරීමට සිදු වේ. රැකියා නොමැති පුද්ගලයන් සතුව වියදම් කිරීමට මුදල් නොමැති වීම තුළ පරිභෝජන දුෂ්කරතා මතුවීම මගින් ජනතාවගේ ජීවන තත්ත්වය පහළ ගොස් ඔවුන්ගේ සුභසාධනය අඩු වේ. එම නිසා මේ ක්‍රියාවලියේ ධනාත්මක ස්වරූපයක් ඇති වීමට නම් රක්ෂණ සේවාව අවශ්‍යම වේ. මෙසේ විස්තරාත්මකව දැක්විය හැකි රක්ෂණයේ ආර්ථිකමය කාර්යභාරය හා වැදගත්කම කරුණු කිහිපයකට ගොනු කර පහත පරිදි පෙන්වාදිය හැකි ය. එනම්,

1. ඇප හා සුරක්ෂිතතා සැපයීම

මූල්‍යමය සහාය සැපයීම මගින් ව්‍යාපාරික හා මිනිස් ජීවිතයේ අවිනිශ්චිතතා අවම කරයි. විශේෂ සිදුවීම්වලට එරෙහිව ආරක්ෂාව හා සුරක්ෂිතභාවය ලබා දෙයි. පුද්ගලයන් තුළ හදිසි අහිමි වීම් පිළිබඳ බිය සෑම විටම පවතින බැවින් රක්ෂණය යම් හදිසි පාඩුවක් සඳහා ආවරණ සලසයි.

2. මූල්‍ය සම්පත් උත්පාදනය

වාරික මුදල් එකතු කිරීම මගින් අරමුදල් ජනිත කරවයි. එනම් මෙම මුදල් රජයේ කොටස් හා සුරැකුම්පත්වල ආයෝජනය කර අරමුදල් අර්ථවත් ලෙස වැඩි මුදල් ජනනය සඳහා රටේ කර්මාත්ත සංවර්ධනය සඳහා යොදවනවා මෙන් ම ආර්ථික වර්ධනය සඳහා ද උපයෝජනය වේ. ප්‍රාග්ධන සම්පාදනයට තුඩු දෙන විශාල ආයෝජන මගින් සේවා නියුක්ති අවස්ථා නිර්මාණය වේ.

3. ජීවිත රක්ෂණය ඉතුරුම් ධෛර්යමත් කරයි.

රක්ෂණය අවදානම් හා අවිනිශ්චිතතාවලට එරෙහිව ආරක්ෂාව සැපයීම පමණක් නොව ආයෝජන මාර්ගයක් ද සපයයි. රක්ෂණය තුළින් විධිමත් වාරික ගෙවීමක් සිදුවන නිසා ක්‍රමවත් ඉතුරුම් ප්‍රවාහයකට මඟ සලයසි. මේ අනුව ජීවිත රක්ෂණය ආයෝජන ක්‍රමයක් සපයයි. එය වාරික ගෙවීම මගින් ඉතිරි කිරීමේ පුරුද්ද වර්ධනය වේ. එනම් පෞද්ගලික ඉතුරුම් වැඩි කිරීමට හේතු වේ.

4. ආර්ථික වර්ධනයට අනුබල දිම

රක්ෂණය දේශීය ඉතිරිකිරීම් එකතුකිරීම මගින් ආර්ථිකයට සැළකියයුතු බලපෑමක් කරයි. එය සංචිත ප්‍රාග්ධනය ඵලදායී ආයෝජනවලට හරවනු ලබයි. පාඩු අවම කිරීම, මූල්‍ය ස්ථාවරත්වය ඇති කිරීම, වෙළෙඳ හා වාණිජ කටයුතු සඳහා සහාය දීම වැනි ක්‍රියාකාරකම් රක්ෂණය මගින් ඉටු වීම ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට හේතු වේ. මේ නිසා රක්ෂණය ආර්ථිකයේ තිරසාර සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් කරනු ලබයි.

5. වෛද්‍ය ආධාර සහාය

සෞඛ්‍ය අවදානම් කළමණාකරණය කිරීමේදී සෞඛ්‍ය රක්ෂණය අත්‍යවශ්‍ය බව පැහැදිළි වේ. සෑම පුද්ගලයෙකුම බලාපොරොත්තු නොවූ බරපතල රෝගී තත්ත්වයන්ට ගොදුරු විය හැකි ය. විවිධ වර්ගයේ සෞඛ්‍ය අවදානම් සඳහා රක්ෂිතයා වෛද්‍ය රක්ෂණ ඔප්පුව ආධාරයෙන් වෛද්‍ය සහාය ලබාගනී. මෙය පුද්ගල සුභසාධනය වැඩිවීමට හේතු වේ.

6. අවදානම විහිදුවීම

රක්ෂණය මඟින් අවදානම රක්ෂිතයාගෙන් රක්ෂකයාට භාර කිරීමක් සිදුවේ. ඒ අනුව රක්ෂණයේ මූලික මූලධර්මය විශාල පිරිසක් අතර අවධානම පැතිරවීම වේ. එම නිසා බොහෝ පිරිසක් රක්ෂණ ඔප්පු ගැනීමෙන් වාරික රක්ෂකයාට ගෙවනු ලබයි. අලාභහානි වූ විට රක්ෂකයා ඔවුන්ට හානි පූර්ණය සඳහා වන්දි ගෙවයි.

7. අරමුදල් රැස් කිරීමේ ක්‍රමවේදයක් ලෙස

රක්ෂණය තුළ වාරික මාර්ගයෙන් විශාල අරමුදල් ප්‍රමාණයක් එකතුකර ගැනීමේ හැකියාව ඇත. මෙම අරමුදල් ආර්ථික වර්ධනය වේගවත් කරන රටේ කාර්මාන්ත සංවර්ධනය සඳහා යෙදවීම සිදු වේ. එවැනි විශාල ආයෝජන මඟින් රැකියා අවස්ථා විශාල ලෙස නිර්මාණය වේ. මේ නිසා රක්ෂණය ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැදගත් මූලාශ්‍රයක් බවට පත් වී ඇත.

8. උද්ධමනය අඩු කිරීම

උද්ධමනය ඇතිවන්නේ මුදල් සැපයුම වැඩි වීමෙන් හා අවම නිශ්පාදන ප්‍රවේශයන් ඇති විට ය. රක්ෂණය මඟින් උද්ධමන පීඩනය අවම කිරීමට දෙවිධියකින් දායක වේ. එක් අතකින් වාරික මඟින් මුදල් අය කිරීම නිසා පුද්ගලයන් අත ඇති අමතර ද්‍රවශීලතාව උරා ගැනීමක් කරන නිසා අතිරේක මුදල් සැපයීම පාලනය වන අතර අනෙක් අතට ප්‍රමාණවත් අරමුදල් ප්‍රමාණයක් නිෂ්පාදන ඒකකයන්ගේ වර්ධනයට මඟ පාදයි. එම නිසා මෙම දෙ ආකාරයෙන් ම උද්ධමනයේ බලපෑම අඩුවීමක් සිදු වේ.

9. රජයට ආදායම් සැපයීම

රක්ෂණ ආයතන හා ඔවුන්ගේ සේවකයන් බදු ගෙවයි. 2002 ජූලි 09 දින සිට රජයේ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති සෙස් බද්ද ශ්‍රී ලංකාවේ රක්ෂණ ආයතන ගෙවිය යුතු වේ. ඒ අනුව දිගුකාලීන රක්ෂණයෙන් 0.2%ක වාර්ෂික බද්දක් හා සාමාන්‍ය රක්ෂණයෙන් 0.4%ක සෙස් බද්දක් සෑම රක්ෂණ ආයතනයක් ම රජයට ගෙවිය යුතු වේ. මෙසේ බදු මඟින් රැස්කර ගන්නා මුදල් රජයේ වැඩසටහන් මඟින් දුප්පත් පුද්ගලයන්ට අධ්‍යාපනය සඳහා යොමු කිරීම, රටේ ආරක්ෂාව සහතික කිරීම වැනි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා යෙදවේ.

**රක්‍ෂණ අංශයේ උපනතීන්**

2010 වර්ෂය තුළ රක්‍ෂණ සමාගම් 19ක් රක්‍ෂණ තැරැව්කාර සමාගම් 48ක් හා රක්‍ෂණ නියෝජිතයින් 37000කින් සමන්විත විය. එම වසර තුළ රක්‍ෂණ අංශයේ වර්ධනයක් පෙන්නුම් කරන ලදි. රක්‍ෂණ අංශයේ මුළු වත්කම් ප්‍රමාණය 22% කින් ආදායම 40%කින් හා බදු පෙර ලාභය 262% කින් ඉහළ යාම මඟින් රක්‍ෂණ කටයුතුවල ප්‍රසාරණය පෙන්නුම් කෙරේ. රක්‍ෂණ අංශයේ ප්‍රධාන වත්කම රජයේ සුරැකුම්පත් වේ. වර්ෂය තුළ රක්‍ෂණ කර්මාන්තයේ නියාමන පනතට අනුව යෝජිත සංශෝධනයන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් රක්‍ෂණ සමාගම් හා තැරැව්කරුවන්ට ප්‍රාග්ධන අවශ්‍යතාවන් නියම කිරීම, රක්‍ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යාමට නීති හා නිර්ණායකයන් සකස් කිරීම, අර්බුද නිරාකරණයේ යෙදීම, රක්‍ෂණ සමාගම්වල අධ්‍යක්‍ෂ මණ්ඩලය හා තැරැව්කරුවන් පත් කිරීම සම්බන්ධව ශක්තිමත් හා යෝග්‍ය නිර්ණායකයන් තීරණය කිරීම ආදී බලතල ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයට පැවරීම සිදු විය. එසේම එම වසරේදී සියලුම රක්‍ෂණ සමාගම් කොටස් වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත වීම අනිවාර්ය වන බවට තීරණය විය.

2011 වර්ෂය වන විට ලියාපදිංචි රක්‍ෂණ සමාගම් 21ක් දක්වා වැඩි විය. ජාතික රක්‍ෂණ භාර අරමුදල් පනත මඟින් පිහිටුවනු ලැබූ ජාතික රක්‍ෂණ භාර අරමුදල ශ්‍රී ලංකා රක්‍ෂණ මණ්ඩලයට ගෙන ඇත. රක්‍ෂණ සමාගම් අංශය වර්ධනය වූ ආර්ථික පරිසරය තුළ ශක්තිමත්ව වාරික ආදායමේ ස්ථාවර වර්ධනයක් වාර්තා කර ඇත. කෙසේ වෙතත් කොටස් වෙළෙඳපොළ මිල ගණන් හා භාණ්ඩාගාර බිල්පත්වල ඵලදාව අඩුවීම නිසා රක්‍ෂණ සමාගම්වල සමස්ත ආයෝජන ආදායම 38%ක් ලෙස රුපියල් බිලියන 22කින් පහත වැටී ඇත.

මූල්‍ය අංශයේ වත්කම්වලින් 3%ක් වන රක්‍ෂණ අංශය 2012 දෙසැම්බර් අවසානය වන විට ලියාපදිංචි රක්‍ෂණ සමාගම් 22ක් විය. එම වර්ෂය තුළ රක්‍ෂණ අංශයේ සමස්ත වත්කම්, වාරික ආදායම, ආයෝජන ආදායම හා ලාභාදායිත්වය ප්‍රසාරණය වී ඇත. 2012 වර්ෂයේදී වත්කම් 16%කින් වර්ධනය වී ඇති අතර රක්‍ෂණ සමාගම්වල සමස්ත ආයෝජන ආදායම 15%කින් රුපියල් බිලියන 26 දක්වා වර්ධනය වී ඇත. රක්‍ෂණ සමාගම්වල සමස්ත ආදායම එනම් ආයෝජන ආදායම හා වාරික ආදායම 12%ක් ලෙස රුපියල් බිලියන 115කින් හා බදුවලට පෙර ලාභය 8.4%ක් ලෙස රුපියල් බිලියන 13.4 කින් වර්ධනය වී ඇත. රක්‍ෂණ අංශයේ සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස රජයේ සුරැකුම්පත්වල කළ ආයෝජන 41%ක් හා කොටස්වල සිදුකළ ආයෝජන 11%කි. සාංගමික ණය සුරැකුම්පත්වල සිදුකළ ආයෝජන රක්‍ෂණ සමාගම්වල සමස්ත වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 5.5%ක් විය. 2016 වන විට සියලු ම රක්‍ෂණ සමාගම් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීම අනිවාර්ය කිරීම මඟින් ලැයිස්තුගත කළ සමාගම්වල පාරදෘශ්‍ය භාවය සහතික කරනු ලබන අතර අවශ්‍ය විටෙකදී ප්‍රාග්ධනය රැස් කිරීම සඳහා කොටස් වෙළෙඳපොළට ප්‍රවේශ වීමට මෙමඟින් හැකියාව පවතී (මහ බැංකුව, 2012).

මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් 3.5% ක් වූ රක්‍ෂණ අංශය 2013 වසර අවසානයේ ලියාපදිංචි රක්‍ෂණ සමාගම් 21ක්, රක්‍ෂණ තැරැව්කරුවන් 54ක් හා නියෝජිතයින් 37000කින් ද යුතුව රක්‍ෂණ ව්‍යාපාර කටයුතුවල නිරත වී ඇත. ඒ වන විට කොටස්

වෙළෙඳපොළෙහි ලැයිස්තගත රක්ෂණ සමාගම් 7ක් විය. 2013 වර්ෂය වන විට රක්ෂණ අංශයේ මුළු වාරික ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස 1.14%කි. රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම් 13.8%කින් ඉහළ ගොස් ඇති අතර සමස්ත ආයෝජන ආදායම රුපියල් බිලියන 29 දක්වා 23%කින් වර්ධනය වී ඇත. රජයේ සුරැකුම්පත්වල හා සාංගමික ණය සුරැකුම්පත්වල විශාල වශයෙන් ආයෝජනය සිදුකළ දිගුකාලීන රක්ෂණ අංශයේ ආයෝජන ආදායම සැළකිය යුතු ලෙස වැඩි වීම සමස්ත ආයෝජන ආදායමේ ඉහළ යාමට හේතු වී ඇත. 2013 අවසානය වන විට රජයේ සුරැකුම්පත්වල සිදුකළ ආයෝජන එම අංශයේ සමස්ත වත්කම්වලින් 43%ක් වූ අතර සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව එය එම අංශයේ වත්කම්වලින් 19%ක් විය. වසර අවසානයේ රක්ෂණ අංශයේ කොටස්වල හා සාංගමික ණය සුරැකුම්පත්වල ආයෝජනය පිළිවෙළින් සමස්ත වත්කම්වලින් 11%ක් හා 10.7%ක් විය. එසේම රක්ෂණ සමාගම්වල මූල්‍යමය ශක්තිමත්භාවය වර්ධනය කිරීමේ අරමුණින් රක්ෂණ හා තැරැව්කාර සමාගම් විසින් පවත්වාගෙන යා යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉහළ දමන ලදි. ඒ අනුව 2015 වසරේ සිට රක්ෂණ සමාගම් සිය ප්‍රාග්ධනය රුපියල් මිලියන 500 කට වඩා නොඅඩු මට්ටමකින් හා තරුැරැව්කාර සමාගම් 2014 වසරේ සිට සිය ප්‍රාග්ධනය රුපියල් මිලියන 2.5 කට වඩා නොඅඩු මට්ටමක පවත්වාගෙන යා යුතු වේ.

මූල්‍ය අංශයේ සමස්ත වත්කම්වලින් 3.4%ක් වූ රක්ෂණ අංශය තුළ 2014 වසරේදී රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි කළ රක්ෂණ සමාගම් 21න් 12ක් සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවලත්, සමාගම් 6ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතුවල පමණක් හා සමාගම් 3ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල පමණක් නිරත වී ඇත. එම වර්ෂය තුළ රක්ෂණ තැරැව්කරුවන් 58ක් හා රක්ෂණ නියෝජිතයින් වසර අවසානය වන විට 36,598ක් විය. රක්ෂණ සමාගම් 7ක් හැර ඉතිරි සමාගම් සියල්ල ද 2016 පෙබරවාරි වන විට ලැයිස්තුගත වීමට නියමිත වේ. දළ ජාතික නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස රක්ෂණ වාරික ආදායම 1.05%ක් වූ අතර 2014 අවසානය වන විට 13.2%ක හිතකර වර්ධනයක් වාර්තා කරමින් රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 411.7 ක් වාර්තා කර ඇත. 2013 වසරේ දී එය 13.0%ක් ලෙස රුපියල් බිලියන 363.8 කි. රක්ෂණ අංශය රජයේ සුරැකුම්පත්වල සිදුකළ ආයෝජනය 2014 වසර අවසාන වනවිට 2013 වසර අවසානයේ වූ 13.0% සිට 15.5%ක් දක්වා වැඩි වී ඇත. සමස්ත ආයෝජනවලින් සාංගමික ණය සුරැකුම්පත්වල සිදුකළ ආයෝජන 2013 වසරේ දී 12.6% සිට 2014 වසරේ දී 13.6%ක් විය.

2014 වසර තුළ මූල්‍ය අංශයේ වත්කම්වලින් 3.4%ක් හිමි රක්ෂණ අංශය 2015 වර්ෂය තුළ 3.3% දක්වා පහත වැටී ඇත. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතේ ලියාපදිංචි රක්ෂණ සමාගම් 28ක් හා රක්ෂණ තැරැව්කරුවන් 57ක් පැවති අතර රක්ෂණ සමාගම් 3ක් සාමාන්‍ය හා දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවලත් සමාගම් 13ක් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු හා සමාගම් 12ක් දිගුකාලීන රක්ෂණ ව්‍යාපාර කටයුතුවල පමණක් නිරත විය. 2015 වසර තුළ රක්ෂණ වාරික ආදායම දළ ජාතික නිෂ්පාදිතතයෙහි ප්‍රතිශතයක් ලෙස 1.0%ක් දක්වා පහත වැටී ඇත. වසර අවසාන වනවිට රක්ෂණ සමාගම්වල සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 453.6ක් විය. 2015 වර්ෂය

අවසාන වනවිට රජයේ සුරැකුම්පත්වල සිදුකළ ආයෝජන දිගුකාලීන අංශයේ වත්කම්වලින් 44.8%ක් ද සාමාන්‍ය අංශයේ වත්කම්වලින් 20.7%ක් ද විය. සාමාන්‍ය රක්ෂණ අංශයෙහි සමස්ත ආයෝජන කළඹින් කොටස්වල සිදුකළ ආයෝජනය 2014 වසරේ දී 20.6% සිට 2015 වසර තුළ 20.4% දක්වා පහළ ගොස් ඇත. සාමාන්‍ය රක්ෂණ අංශය මඟින් සාංගමික ණය සුරැකුම්පත්වල සිදුකළ ආයෝජනය 2014 වසරේ දී 6.6% සිට 2015 වසර අවසානය වනවිට 8.1%ක් විය.

**සමාලෝචනය**

මේ අනුව රක්ෂණය වූ කලී පුද්ගලයා, ව්‍යාපාරිකයා හා ආයෝජකයා නිතර මුහුණදෙන අවදානම් හා අවිනිශ්චිතතාවන් මඟින් වන පිරිවැය අවම කරගැනීමේ ක්‍රියාමාර්ගයක් ලෙස හඳුනාගත හැකි ය. රක්ෂණ ආයතන ලාභ ලැබීමේ අරමුණින් රක්ෂණ ව්‍යාපාර කටයුතු සිදු කරන අතර එමඟින් මුළු ආර්ථිකයට ම බලපාන ලෙස අවදානම අවම කර සමස්තයක් ලෙස පුද්ගල සුභසාධනය උපරිම කිරීමට දායකත්වය සපයයි. එසේම ව්‍යාපාරිකයා නිතර මුහුණදෙන විවිධ අවදානම් අවම කිරීමේ ක්‍රියාවලියේ නිරත වේ. මේ නිසා රක්ෂණය ආර්ථිකයේ විවිධ අංශ කෙරෙහි විවිධාකාරයේ දායකත්වය සැපයීම තුළ එහි වැදගත්කම පුළුල් පරාසයක විහිද පවතිනු දැකිය හැකි වේ. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ ද රක්ෂණ අංශය නීතිමය හා ආයතනික වශයෙන් ක්‍රමවත් වීමත් වර්ධනය වන උපනතියක් පිළිබිඹු කරයි. මේ අනුව සමස්තයක් ලෙස රක්ෂණ ක්ෂේත්‍රය රටකට ආර්ථිකමය වශයෙන් වැදගත් උපකාරක සේවාවක් සපයන අංශයක් ලෙස හැඳින්විය හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ජයතිලක නිමල්, (1993), වාණිජ්‍යය හා මූල්‍යය, එස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

බණ්ඩාරනායක ජගත්, (2012), කතෘ ප්‍රකාශන, උසස් පෙළ ව්‍යාපාර අධ්‍යයනය (පළමු කොටස), කතෘ ප්‍රකාශන.

රණසිංහ අතුල (2009), උසස් සූක්ෂම ආර්ථික න්‍යාය, කතෘ ප්‍රකාශන.

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය (2010), ව්‍යාපාර අධ්‍යයනය, ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය, කොළඹ 05.

මහ බැංකු වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව. 2010 - 2015.